ඈත ඈත අතීතයෙහි
බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙක්
දඹදිව බරණැස් නුවර රාජ්‍යය කළහ.
බරණැස් පුරයට නුදුරින්
මහා වනාන්තරයක් විය.
එහි බොහෝ සතා සීපාවෝ වාසය කළහ.
(c) Sumitha Publishers
නොයෙක් වර්ගවල කුරුල්ලෝ ද එහි විසූහ.
ඒ අතර වටු කුරුල්ලෝ ද රංචු රංචු සිටියහ.
ඒ කාලයෙහි කුරුල්ලන්ට
කතා කරන්නට ද පුළුවන් විණ.
ඔවුන්ට ද රජෙක් සිටියේය.
කුරුලු රජා සිය රංචුවල කුරුල්ලන්
ආදරයෙන් රැක බලා ගත්තේය.


(c) Sumitha Publishers

වටු කුරුල්ලන් අල්ලා විකුණන දඩයක්කාරයෙක් ද
මේ වනාන්තරයෙහි විසුවේය.
ඔහු වනයට ගොස්
වටු කුරුල්ලෙකු මෙන් හඬක් නඟයි.
අහිංසක වටු කුරුල්ලෝ ඒ හඬ අසා
එතැනට පියාඹා එති.
(c) Sumitha Publishers
එවිට දඩයක්කාරයා හෙමින් සීරුවේ
එතැනට ගොස් සිය දැල විහිදුවා
කුරුල්ලන් අල්ලා ගනී.
ඔහු කුරුල්ලන් රැගෙන නගරයට ගොස්
උන් විකුණා ජීවත් වූයේය.